# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,148 - 2019 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2019.11.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 2118 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 2119 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 නොවැම්බර් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 නොවැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## මන්මුනෙයි දකුණු එරුවිල් පත්තුව ප්‍රාදේශීය සභාව

### මන්මුනෙයි දකුණු එරුවිල් පත්තුව ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ප්‍රදේශ සංවර්ධිත ප්‍රදේශයන් ලෙස ප්‍රකාශ කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මන්මුනෙයි දකුණු එරුවිල් පත්තුව ප්‍රාදේශීය සභාව විසින් 2019 වසරේ ජුනි මස 27 වෙනි දිනැති 16 වෙනි මහා සභා රැස්වීමේදී, දරන තීරණ අංක 2019/236 යටතේ සභාවෙන් සම්මත කරන ලද යෝජනාවට එකී පනතේ ඉහත කී වගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පැවරී ඇති බලතල යටතේ මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් සින්නරාජා ප්‍රගාශ් වන මම අනුමැතිය ලබාදෙන බව මහජනයාට දැනුම් දෙමි.

සින්නරාජා ප්‍රගාශ්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මන්මුනෙයි දකුණු එරුවිල් පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පහත උපලේඛනයේ සඳහන් කර ඇති ප්‍රදේශ සංවර්ධිත ප්‍රදේශයන් ලෙස සම්මත කළ යුතු බවත් එසේ පිළිගැනීමේ යෝජනා නීත්‍යානුකූල ක්‍රියාත්මක කිරීම සඳහා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ක්‍රියා කළ යුතු බවත් මන්මුනෙයි දකුණු එරුවිල් පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

| *ගම්මාන* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක* |
|---|---|---|
| සෙට්ටිපාලෙයියම් | සෙට්ටිපාලෙයියම් උතුර | 126A 1 |
| | සෙට්ටිපාලෙයියම් දකුණ | 126A 2 |
| මාංකාඩු | මාංකාඩු | 123 |
| තේත්තාතීවු | තේත්තාතීවු උතුර | 122 |
| | තේත්තාතීවු දකුණ | 122A |
| | තේත්තාතීවු දකුණ | 01-122B |
| | තේත්තාතීවු දකුණ | 02-122C |
| එරුවිල් | එරුවිල් උතුර | 115 |
| | එරුවිල් දකුණ | 115A |
| | එරුවිල් නැගෙනහිර | 115B |
| කුරුමන්වෙලි | කුරුමන්වෙලි II නැගෙනහිර | 114 |
| | කුරුමන්වෙලි II බටහිර | 114B |
| | කුරුමන්වෙලි | 12-114A |
| මහිලූර් | මහිලූර් නැගෙනහිර | 110A |
| | මහිලූර් බටහිර | 110 |
| | මහිලූර් මුනෙයි | 110B |
| | මහිලූර් නිරිත | 110C |
| ඔන්තාච්චිමඩම් | ඔන්තාච්චිමඩම් උතුර | 111 |
| | ඔන්තාච්චිමඩම් දකුණ | 111A |
| තුරෙයිනීලාවනෙයි | තුරෙයිනීලාවනෙයි උතුර | 74 |
| | තුරෙයිනීලාවනෙයි උතුර | 01-74B |
| | තුරෙයිනීලාවනෙයි දකුණ | 74 A |
| | තුරෙයිනීලාවනෙයි දකුණ | 1-74C |

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සමුපකාර සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය

### මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීම (සීමිත/විවෘත) 2019

මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුරු සඳහා පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ :-

01. *පුරප්පාඩු තනතුරු :*

01. උපදේශක III ශ්‍රේණිය (ලී වැඩ)
02. උපදේශක III ශ්‍රේණිය (ලුහු ඉංජිනේරු)
03. උපදේශක III ශ්‍රේණිය (විදුලි)
04. උපදේශක III ශ්‍රේණිය (පරිගණක)
05. උපදේශක III ශ්‍රේණිය (මෝටර් කාර්මික)
06. උපදේශක III ශ්‍රේණිය (බහුකාර්ය ඉදිකිරීම් තාක්ෂණය)

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2019.11.22 වැනි දින වේ.

03. *පොදු කොන්දේසි.-*

3.1 අපේක්ෂකයින් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

3.2 2019.11.22 දිනට පූර්වාසන්න වූ වසර (05) ක් ඇතුලත මධ්‍යම පළාත තුළ යටත් පිරිසෙයින් වසර (03) ක් වත් අඛණ්ඩ ස්ථිර වශයෙන් පදිංචියක් තිබිය යුතුය.

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන 2019.11.22 දිනට වයස අවුරුදු 18 නොඅඩු 30 ට නොවැඩි අයට ඉල්ලුම් කළ හැකිය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

04. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්.-*

4.1 විවෘත බඳවාගැනීම් සඳහා :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම් සියලු තනතුරු සඳහා අ.පො.ස. (සා. පෙ.) සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| උපදේශක III ශ්‍රේණිය (ලී වැඩ)<br>උපදේශක III ශ්‍රේණිය (ලුහු ඉංජිනේරු)<br>උපදේශක III ශ්‍රේණිය (විදුලි)<br>උපදේශක III ශ්‍රේණිය (පරිගණක)<br>උපදේශක III ශ්‍රේණිය (මෝටර් කාර්මික)<br>උපදේශක III ශ්‍රේණිය<br>(බහු කාර්ය ඉදිකිරීම් තාක්ෂණය) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය යන විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ.) විභාගය සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තිබීම. | බඳවා ගන්නා ක්ෂේත්‍රයට අදාළව හා ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයට අදාළව තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් තුන්වන මට්ටම (NVQ Level 03) හා හතරවන මට්ටම (NVQ Level 04) විභාග යෙන් ප්‍රායෝගික හා න්‍යායික විෂයයන් සහිතව සමත්ව තිබීම හෝ මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ පුහුණු ආයතනයක් මගින් පවත්වා ඇති බඳවා ගනු ලබන ක්ෂේත්‍රයට අදාළව එක් අවුරුදු පාඨමාලාවක් හදරා ප්‍රායෝගික හා න්‍යායික විෂයයන් සියල්ලට සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහළ සුදුසුකම් සහිතව විභාගය සමත්ව තිබීම හෝ රජයේ පිළිගත් ආයතනයකින් බඳවා ගනු ලබන ක්ෂේත්‍රයට අදළව අවුරුදු 1 ක ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ ඊට ඉහළ සුදුසුකම් සහිත පාඨමාලාවක් හදාරා එහි අවසන් විභාගය සමත්ව තිබීම. |

4.1.1 *පළපුරුද්ද :*

රජයේ ලියාපදිංචි ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසරකට නොඅඩු ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්දක් ලබා තිබීම හෝ මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ බාහිර උපදේශකයෙකු ලෙස කටයුතු කරමින් සිටීම.

4.2 *සීමිත බඳවාගැනීම් සඳහා :*

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම් සියලු තනතුරු සඳහා අ.පො.ස. (සා. පෙ.) සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| උපදේශක iii ශ්‍රේණිය (ලී වැඩ)<br>උපදේශක iii ශ්‍රේණිය (ලුහු ඉංජිනේරු)<br>උපදේශක iii ශ්‍රේණිය (විදුලි)<br>උපදේශක iii ශ්‍රේණිය (පරිගණක)<br>උපදේශක iii ශ්‍රේණිය (මෝටර් කාර්මික)<br>උපදේශක iii ශ්‍රේණිය<br>(බහු කාර්ය ඉදිකිරීම් තාක්ෂණය) | සිංහල/දෙමළ භාෂාව/ඉංග්‍රීසි හා ගණිතය ඇතුලුව අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් (02)ක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. | බඳවාගනු ලබන ක්ෂේත්‍රයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පවත්වන ජාතික වෘත්තීය නිපුණතා මට්ටම NVQ 3 හා NVQ 4 විභාග සමත්ව තිබීම. |

(සියලු අධ්‍යාපන සුදුසුකම් 2019.11.22 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.)

4.2.1 *පළපුරුද්ද.-* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය කර තිබීම හා පුරප්පාඩු දිනට වසර තුනක (03) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

05. *සේවා කොන්දේසි :-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

06. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා. පරි. ච. ලේ. 3/2016 අනුව MN1-2016

රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 -10 x 660 -රු. 45,540 වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

7.1 විවෘත :

රා.ප.ච. 15/90 අනුව ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විවෘත තරග විභාගයක් පවත්වනු ලැබේ. එම පවත්වනු ලබන ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබාගන්නා අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබයි. මෙම පරීක්ෂණ තුනෙන්ම ලබාගන්නා මුළු ලකුණු අනුපිළිවෙලට බඳවා ගැනීම සිදු කෙරේ.

7.2 සීමිත :

රා.ප.ච. 15/90 අනුව, ප්‍රසිද්ධ දැන්වීම් මගින් හෝ පළාත් සභාවේ ආයතන අතර අභ්‍යන්තර නිවේදනයක් ප්‍රසිද්ධ කිරීම මගින් අයදුම්පත් කැඳවා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සීමිත තරග විභාගයක් පවත්වනු ලැබේ. එම පවත්වනු ලබන ලිඛිත විභාගයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබයි. මෙම පරීක්ෂණ තුනෙන්ම ලබාග න්නා මුළු ලකුණු අනුපිළිවෙලට බඳවා ගැනීම සිදු කෙරේ.

7.2.3 ලිඛිත පරීක්ෂණය : විවෘත/සීමිත

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01. | අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02. | සාමාන්‍ය දැනීම හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාළ දැනුම | පැය 01 | 100 | 40% |

7.2.3.1 විෂය නිර්දේශය :

| අ/අ | විෂයයන් | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූල භාවයන් ද විශ්ලේෂණ හැකියාවන්ද තීරණ ගැනීමේ ශක්තීන් ද, විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| 02 | සාමාන්‍ය දැනීම හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාල දැනුම | දේශපාලනය, ඉතිහාසය, විද්‍යාත්මක තොරතුරු, භාෂාව, සාහිත්‍ය හා ක්‍රීඩා යනාදී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර හා දේශීය කාලීන සාමාන්‍ය දැනීම පිරික්සීම.<br>වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාලව ජාතික මට්ටමේ තත්වයන්, නිර්ණායක හා ප්‍රවණතාවයන් සම්බන්ධ සාමාන්‍ය දැනුම පිරික්සීම. |

7.2.4 ප්‍රායෝගික පරීක්ෂණය - විවෘත/සීමිත

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. ලුහු ඉංජිනේරු ක්ෂේත්‍රය | පැය 03 | 100 | 40% |
| 2. ලී වැඩ ක්ෂේත්‍රය | පැය 03 | 100 | 40% |
| 3. විදුලි ක්ෂේත්‍රය | පැය 03 | 100 | 40% |
| 4. පරිඝණක ක්ෂේත්‍රය | පැය 03 | 100 | 40% |
| 5. මෝටර් කාර්මික ක්ෂේත්‍රය | පැය 03 | 100 | 40% |
| 6. බහුකාර්ය ඉදිකිරීම් ක්ෂේත්‍රය | පැය 03 | 100 | 40% |

7.2.4.1 විෂය නිර්දේශය :

| ක්ෂේත්‍රය | විෂයයන් | විෂය නිර්දේශය |
|---|---|---|
| 01. ලුහු ඉංජිනේරු උපදේශක | යාන්ත්‍රණය | * ලියවන පට්ටලය හා කොටස්<br>* කැපුම් වේග භාවිතය<br>* අනුමාන භාවිතය නඩත්තු කිරීම හා අළුත්වැඩියාව |
| | ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම | * ඇඳීමේ උපකරණ භාවිතය<br>* ජ්‍යාමිතික රටා හා මෝස්තර නිර්මාණය |
| | වෘත්තීය ගණිතය | * මූලික ගණිත ක්‍රම<br>* ඇස්තමේන්තු සැකසීම |
| 02. ලී වැඩ උපදේශක | වෘත්තීය ගණිතය | * මූලික ගණිත ක්‍රම<br>* පැරණි මිණුම් ඒකක<br>* ලී කැපුම් ලැයිස්තු සෑදීම<br>* ඇස්තමේන්තු සැකසීම |
| | ආවුධ භාවිතය හා දැව | * මූලික ආවුධ හඳුනා ගැනීම හා භාවිතය<br>* දැව ශ්‍රේණි ගත කිරීම හා පදම් කිරීම<br>* නවීන ආයුධ භාවිතය පිළිබඳ දැනුම |
| | ජ්‍යාමිතික ඇඳීම | * ජ්‍යාමිතික උපකරණ භාවිතය<br>* ජ්‍යාමිතික හැඩතල ඇඳීම<br>* ජ්‍යාමිතික මෝස්තර නිර්මාණය |

| *ක්ෂේත්‍රය* | *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| | මූට්ටු | * විවිධ මූට්ටු වර්ග පිළිබඳ දැනුම |
| 03. පරිගණක උපදේශක | පරිගණක විද්‍යාවේ මූලිකාංග | * පරිගණකයේ ඉතිහාසය<br>* පරිගණක විද්‍යාවේ විකාශනය<br>* පරිගණක වර්ගීකරණය |
| | මෘදුකාංග හඳුනා ගැනීම හා භාවිතය | * මෘදුකාංග වර්ගීකරණය<br>* විවිධ මෘදුකාංග එකලස් කිරීම<br>* මෘදුකාංග සකස් කිරීම<br>* මෘදුකාංග ප්‍රායෝගික භාවිතය |
| | දෘඩාංග හඳුනා ගැනීම හා භාවිතය | * දෘඩාංග වර්ගීකරණය<br>* දෘඩාංග විකාසනය<br>* දෘඩාංග එකලස් කිරීම |
| | පරිගණක ජාල තාක්ෂණය | * ජාලගත කිරීමේ ක්‍රමවේද<br>* ජාල වර්ගීකරණය<br>* පරිගණක ජාල තාක්ෂණය භාවිතය |
| | තොරතුරු පද්ධති හා තොරතුරු සන්නිවේදනය | * දත්ත හා තොරතුරු<br>* තොරතුරු පද්ධති එකලස් කිරීම<br>* තොරතුරු සන්නිවේදන ක්‍රමෝපායන් |
| 04. විදුලි උපදේශක | මූලික දැනුම | * එකලා හා තෙකලා විදුලි පද්ධති විදුලි උත්පාදනය, ආරක්ෂාව, භාවිතා කරන ආයුධ, උපකරණ හා වයර් වර්ග |
| | කේත සංකේත භාවිතය | * සැලසුම් ඇඳීම, වර්ණ අනුව වයර් හඳුනා ගැනීම<br>* පරිපථ ඇඳීම<br>* ඇස්තමේන්තු සකස් කිරීම |
| | විදුලි උපකරණ සවි කිරීම | * උපකරණ අනුව පරිපථ සකස් කිරීම හා රැහැන් යෙදීම |
| | මූලික කර්මාන්ත ශාලා පුහුණුව | * ආරක්ෂාව<br>* මූලික මිනුම් හා උපකරණ<br>* සළකුණු කිරීම<br>* විදීම/හිමැදීම/යන්ත්‍ර කිරීම |
| 05. මෝටර් කාර්මික උපදේශක | එන්ජිම | * මූලික සිද්ධාන්ත<br>* ජ්වලන ක්‍රම<br>* ඩීසල් එන්ජිමේ මූලික ජ්වලන ක්‍රියාකාරීත්වය<br>* සිසිලන පද්ධතියේ මූලික ක්‍රියාකාරීත්වය<br>* ස්නේහක හා එහි ක්‍රියාකාරීත්වය |
| | සම්ප්‍රේෂණ කිරීම | * ක්ලච්<br>* ගියර<br>* ඩිපරන්ෂලය |
| | සුක්කානම්, තිරිංග, අවලම්භන හා විදුලි පද්ධති | * මූලික දැනුම |

| *ක්ෂේත්‍රය* | *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 06. බහුකාර්ය ඉදිකිරීම් උපදේශක | ගොඩනැගිලි සැලසුම් කිරීම | * සංකේත කේත, කෙටි යෙදුම්'' ක්ෂේත්‍ර සැලසුම්'' මිනුම් ක්‍රම |
| | පෙදරේරු වැඩ | * අමුද්‍රව්‍ය මිශ්‍රණ අනුපාත'' පාදම වර්ග |
| | ගඩොල් වැඩ | * පිරිවිතර<br>* කම්කරු ශ්‍රමය<br>* උපකරණ<br>* ක්‍රමවේද හා තාක්ෂණය භාවිතය |
| | බිම සකස් කිරීම | * සැලසුම් කිරීම හා සංවිධානය<br>* යෝග්‍යතා පරීක්ෂණය<br>* පාරිසරික සාධක |
| | කපරාදු කිරීම | * පිරිවිතර<br>* යෙදවුම් ක්‍රමවේද<br>* කම්කරු ශ්‍රමය |

7.2.5 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : විවෘත/සීමිත

| *පරීක්ෂා කරනු ලබන විෂය ක්ෂේත්‍රයට අදාළව* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක වෘත්තීය සුදුසුකම් | 50 | |
| 2. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද රජයේ/රජයේ ලියාපදිංචි ආයතනයක/පිළිගත් පෞද්ගලික ආයතනයක (සේවා සහතික ඉදිරිපත් කළ යුතුය.) | 40 | 40% |
| 3. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | <u>10</u> | |
| මුළු ලකුණු | <u>100</u> | |

8. *අයදුම් කිරීමේ ක්‍රමය :*

8.1 විභාග ගාස්තු වශයෙන් රු. 600 ක් මධ්‍යම පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-03 ප්‍රධාන ලේකම් (මධ්‍යම පළාත) ට බැරවන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද ලදුපත, අයදුම්පතට අමුණා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

8.2 මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ-4 ප්‍රමාණයේ (සෙ. මී. 21. x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.11.22 වැනි දිනට පෙර **''ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය, තැ. පෙ. 41, ගැටඹේ, පේරාදෙණිය''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''මධ්‍යම පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක තනතුර සඳහා බඳවා ගැනීම - 2019''** යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8.3 අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම් ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අදාළ කරුණු හෝ එම නිවේදනයේ ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

ඩබ්. එම්. කේ. කේ. කරුණාරත්න,
ලේකම්,
කර්මාන්ත අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

**ආදර්ශ අයදුම්පත**

***මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීම (සීමිත/විවෘත) - 2019***

විභාග අංකය : ..........

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

අයදුම්පත් නිවේදනයේ 01 අනුව
ඉල්ලුම් කරනු ලබන උපදේශක තනතුර : ..........

විවෘත/සීමිත : ..........

01. *(අ)* මුල් අකුරු සමග නම (සිංහලෙන්) :..........
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........

*(ආ)* සම්පූර්ණ නම (සිංහලෙන්) :..........
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........

*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. *(අ)* ස්ථිර ලිපිනය (සිංහලෙන්) :..........
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........

*(ආ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

මහනුවර : ☐ මාතලේ : ☐ නුවරඑළිය : ☐

*(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2019.11.22 වැනි දිනට මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිය :

අවු. :.........., මාස :.........., දින :..........

*(ඈ)* දුරකතන අංකය : පෞද්ගලික :.........., රාජකාරි :..........

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. විභාගයට පෙනී සිටින මාධ්‍ය : ( අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

05. උපන් දිනය : වර්ෂය :.........., මාසය :.........., දිනය :..........

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2019.11.22 වැනි දිනට වයස :

අවු. :.........., මාස :.........., දින :..........

06. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 යටතේ)

6.1 අ.පො.ස. (සා. පෙළ) :

වර්ෂය :......................................, විභාගය අංකය :.......................................

| විෂයය | ලබා ඇති සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස. (උ. පෙළ) :

වර්ෂය :......................................, විභාගය අංකය :.......................................

| විෂයය | ලබා ඇති සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

6.3 නිවේදනයේ 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් :

6.3.1 පුහුණු පාඨමාලාවේ නම :..........................................................................................................................
පුහුණු පාඨමාලාවේ කාලසීමාව :........................................ සිට :............................................................ දක්වා
ආයතනය :..................................................................................................................
සහතිකය වලංගු වන දිනය :....................................................................................

6.3.2 පළපුරුද්ද පිළිබඳ විස්තරය :

ආයතනය :..................................................................................................................
කාලසීමාව :......................................... සිට :............................................................. දක්වා

6.3.3 සීමිත අයදුම්කරුවන් පමණි :

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුර :...........................................................................
එම තනතුරට පත් වූ දිනය :.................................................................................
වැටුප් පරිමාණය :..................................................................................................
තනතුරේ ස්ථිර කළ දිනය :.....................................................................................
ස්ථිර සේවා කාලය (2019.11.22 වැනි දිනට) :...........................................................................

07. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත් අංකය :...............................................................................................
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :...................................................................................
දිනය :................................................

ලදුපත (මුල්පිටපත) නොගැලවෙන ලෙස එහි දාරයක් මෙහි අලවන්න.

08. ................................................................................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති මාගේ දැනීම හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

.....................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ...................................... දින මා ඉදිරිපිටදී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :..........................................................................................
අත්සන :..........................................................................................................................
තනතුර හා නිල මුද්‍රාව :..................................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙක්/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකුගේ /නීතිඥයකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු හෝ වර්ෂයට රු. ............................... නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් සහතික කළ යුතුය.)

10. රජයේ හෝ /පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :
(අනවශ්‍ය වචන කපා හරින්න)

.............................................................................................මහතා/මිය/මෙනවිය දැනට........................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................................................ වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ /ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයකු සේ සලකා ඇති/නැති බවත් පහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

....................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :..................................

11-765

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | රු. ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2019.11.01 | සිකුරාදා | 2019.10.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.08 | සිකුරාදා | 2019.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.15 | සිකුරාදා | 2019.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.22 | සිකුරාදා | 2019.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.29 | සිකුරාදා | 2019.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2019.12.06 | සිකුරාදා | 2019.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.12.13 | සිකුරාදා | 2019.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.12.20 | සිකුරාදා | 2019.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.12.27 | සිකුරාදා | 2019.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2020 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2020.01.03 | සිකුරාදා | 2019.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.01.09 | බ්‍රහස්පතින්දා | 2019.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.01.17 | සිකුරාදා | 2020.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.01.24 | සිකුරාදා | 2020.01.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2020.01.31 | සිකුරාදා | 2020.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.